INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**2021 පෙබරවාරි 03**

**මාධ්‍ය නිවේදනය: ශ්‍රී ලාංකික සාමසාධක හටයන් යෙදවීම අත්හිටුවිය යුතුයි**

**ජොහැන්නස්බර්ග්:** හමුදා හට පිරිස්වල පූර්ව පරීක්ෂාව වෙනුවෙන් ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ආයතනයේ ස්වාධීනත්වය සහ විශ්වසනීයත්වය සහමුලින්ම බාදනය වී ඇති බවට අනතුරු අඟවා සිටින මානව හිමිකම් කටයුතු භාර එක්සත් ජාතීන්ගේ ආයතනයේ නවතම වාර්තාව අනුව යමින් එක්සත් ජාතීන්ගේ සාමසාධක දෙපාර්තමේන්තුව ශ්‍රී ලාංකික හමුදා හට පිරිස් යෙදවීම අත් හිටුවිය යුතුය[1].

*"හමුදා යෙදවීමට පෙර යෝග්‍යතා පරීක්ෂාවක් සිදුවී ඇතිදැයි සහතික කිරීමට එජා සාම මෙහෙයුම් දෙපාර්තමේන්තුව නීතියෙන් බැඳී සිටී,"* යි සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (ITJP) විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. *"එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් වරියගේ වාර්තාවෙන් තහවුරු කර ඇති පරිදි ශ්‍රී ලාංකික හට පිරිස් නිසියාකාරව සෝදිසියට හා පූර්ව පරීක්ෂාවට ලක් කර ඇති බව සහතික කිරීමේ හැකියාවක් දැන් නිව් යෝර්ක් නුවරට නොමැති හෙයින් පූර්ව පරීක්ෂණ ක්‍රියාදාමය ආපසු ජිනීවා නුවරට ගෙන ඒමට වහාම පියවර ගත යුතුය."*

දැනට පවත්වා ගෙන යන වැඩ පිළිවෙල අනුව හට පිරිස් සෝදිසිය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම විසින් කොළඹදී සිදු කරනු ලැබේ. මිෂෙල් බැෂලේ විසින් පෙන්වා දී ඇති පරිදි මානව හිමිකම් කොමිසම දේශපාලනීකරණය වී ඇති අතර රජයේ හිටපු අමාත්‍යවරයකු සභාපති ලෙස පත් කිරීමෙන් එහි ස්වාධීනත්වයට හානි පමුණුවා තිබේ.

යුද අපරාධ වලට සම්බන්ධ බවට එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් චෝදනා එල්ලවී සිටින දෙදෙනකු ශ්‍රී ලංකා යුද හමුදාවේ නායකත්වයට හා ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධානියා ලෙසත් පත්කර තිබීම සම්බන්ධයෙන් විශේෂයෙන් කනස්සල්ලට පත්ව සිටින බවත් මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් මිෂෙල් බැෂලේ පවසා තිබේ. 2019 දී ශවේන්ද්‍ර සිල්වා පත් කළ අවස්ථාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානය දැනුම් දී සිටියේ මෙහෙයුම් අනතුරේ හෙළනු ලැබිය හැකි ස්ථාන වල හැර අනිකුත් ස්ථාන වලට ශ්‍රී ලාංකික සාමසාධක හටයන් යෙදවීම අත්හිටුවන බවයි[2]. ශ්‍රී ලාංකික සාමසාධක හටයන්ගෙන් හතරෙන් පංගුවකට තහනම බලපානු ඇති බව එක්සත් ජාතීන්ගේ සංවිධානය පසුව කළ පැහැදිලි කිරීමකින් කියා සිටියේය. නිශ්චිතවම කියා තිබුනේ ලෙබනනයේ යොදවා සිටි අයවලුන් වෙනුවට වෙනත් රටවලින් හට පිරිස් යොදවනු ඇති බවයි[3].

---

[1] A/HRC/46/20.
[2] https://www.aljazeera.com/news/2019/9/25/sri-lankan-troops-barred-from-un-peacekeeping-over-new-army-chief
Also A/HRC/46/20 §23.
The UN Department of Peacekeeping Operations said it would suspend future Sri Lankan army deployments, "except where suspension would expose UN operations to serious operational risk".
[3] https://www.un.int/srilanka/news/foreign-secretary-aryasinha-discusses-obstacles-placed-sri-lanka’s-peacekeeping-contribution-un

මීට අමතරව, විදෙස් ගතවන ශ්‍රී ලංකාවේ හට කණ්ඩායම් සමුගැනීමේ පෙළපාලි වලදී යුද අපරාධකරුවකු බවට චෝදනා එල්ලවී ඇති ශවේන්ද්‍ර සිල්වාට හමුදා ආචාර දක්වනු දිගින් දිගටම ඡායාරූප ගත කර තිබුණි[4]. මෙය සිදු කෙරුනේ ශවේන්ද්‍ර සිල්වා හමුදාපති ලෙස පත් කිරීමට විරුද්ධව පුළුල් ජාත්‍යන්තර විරෝධයක් මතුවී තිබියදීය[5]. එක්සත් ජාතීන්ගේ විශේෂඥ මණ්ඩලයක් විසින් ශවේන්ද්‍ර සිල්වාගේ පත්වීම හඳුන්වනු ලැබුවේ ඔහුගෙන් පීඩාවට පත් වූවන්ට කළ නිග්‍රහයක් සහ විශ්මය දනවන එකක් ලෙසිනි[6]. මෙම මතය එක්සත් ජනපද රජයෙන්[7], කැනඩාවෙන්[8] හා යුරෝපා සංගමයෙන්[9] ද දෝංකාර නැංවුණි.

ඉන් අනතුරුව බරපතල මානව හිමිකම් උල්ලංඝන චෝදනා සම්බන්ධයෙන් ශවේන්ද්‍ර සිල්වා සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් 2020 පෙබරවාරියේදී එක්සත් ජනපද රජය විසින් ප්‍රසිද්ධියේ තහනමකට ලක් කරන ලදී[10]. ඉන් පසු ශවේන්ද්‍ර සිල්වාට යුද හමුදාවේ ඉහලම නිලය වන වැඩ බලන මාණ්ඩලික ප්‍රධානී තනතුරේ අමතර වගකීම පවරන ලද අතර මෑතදී තරු හතරේ ජෙනරාල් පදවියකට උසස් කරන ලදී[11].

*"යුද අපරාධකරුවන් ලෙස චෝදනා ලබන්නන්ට උසස් වීම් ප්‍රදානය කිරීම හානිදායක ප්‍රතිපල අත් කර දෙන බව ශ්‍රී ලංකාවේ රජයට පෙන්වා දීම සඳහා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් හා යුක්තිය සම්බන්ධයෙන් මහ ලේකම් වරයා දරන මූලධාර්මික ස්ථාවරය හා සමග පෙළ ගැසී කටයුතු කරන්නට එක්සත් ජාතීන්ගේ සාමසාධක දෙපාර්තමේන්තුවට කාලය එළැඹී තිබේ,[12]"* යි සූකා මහත්මිය පැවසුවාය. *"සාමසාධක රැකියා යනු වරප්‍රසාදයක් මිස අයිතියක් නොවේ. මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ අලුත්ම වාර්තාව පැහැදිලිව පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානා හිමිකම් කවුන්සිලයට දුන් පොරොන්දු ඉටු නොකරන බවයි."*

---

[4] https://www.army.lk/news/mali-bound-next-ccc-salutes-commander-army
6 November 2019 – Mali bound
https://alt.army.lk/vir/content/ccc-army-leaves-mali-un-peacekeeping-mission
13 November 2019 - at airport.
http://www.colombopage.com/archive_20B/Nov13_1605287083CH.phpNovember 2020 South Sudan bound.
https://www.tamilguardian.com/content/accused-war-criminal-sends-sri-lankan-troops-un-peacekeeping-mission
November 2020 – South Sudan bound.
https://www.army.lk/news/sri-lanka-army-manufactured-air-conditioned-mali-bound-unibuffels-ready-shipment-0
June 2020 – vehicles for Mali.

[5] OHCHR 19 Aug 2019 Bachelet "deeply troubled" by appointment of new Sri Lankan army chief'
https://www.ohchr.org/en/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=24908&LangID=E

[6] https://www.ohchr.org/en/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=24923&LangID=E

[7] https://twitter.com/usembsl/status/1163400674643759104?lang=en

[8] https://www.canadainternational.gc.ca/sri_lanka/highlights-faits/2019/2019-08-21-statement-declaration.aspx?lang=eng

[9] https://eeas.europa.eu/delegations/lebanon/66564/joint-statement_en

[10] https://www.state.gov/public-listing-january-2020-march-2020/

[11] https://www.army.lk/news/promoted-general-shavendra-silva-honoured-elegantly-dressed-gajaba-regiment-troops-presenting

[12] https://www.un.org/press/en/2020/db201102.doc.htm

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT